සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය I** **කාලය පැය 01 යි.**

නම/ විභාග අංකයඃ

උපදෙස් :
- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විතය.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් වලට අනුකූලව සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න. I පිළිතුරු පත්‍රය II පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

01. ප්‍රජාතන්ත්‍රවාදය සමාජ ජීවන ක්‍රමයක් ලෙස වැදගත් වන්නේ; එය
(1) ජනතා ඡන්දයෙන් වැඩි නියෝජිත පිරිසක් තේරී පත් කරන නිසාය.
(2) නීති සම්පාදන කාර්ය ජනතා නියෝජිතයන් මගින් සිදු කරන නිසාය.
(3) මහජන කැමැත්ත මතම සියලු දේ සිදුවන නිසාය.
(4) සාකච්ඡා මගින් තීරණ වලට එළඹෙන නිසාය.

02. පුරවැසි සභාව යනු,
(1) රාජ්‍යයක පුරවැසියන් එක්ව තීන්දු තීරණ ගන්නා ආයතනයකි.
(2) වජ්ජි ජනපදයේ සමූහාණ්ඩු පාලන මධ්‍යස්ථානයයි.
(3) ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනයයි.
(4) ඇමරිකාවේ පුරවැසියන්ගේ පාලන සභාවයි.

03. ඒක පක්ෂ ක්‍රමය, ද්වි පක්ෂ ක්‍රමය, බහු පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක රටවල් පිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.
(1) ශ්‍රී ලංකාව, ඇමරිකාව, චීනය
(2) උතුරු කොරියාව, එංගලන්තය, ඇමරිකා එක්සත් ජනපදය.
(3) රුසියාව, චීනය, ජපානය
(4) කියුබාව, මහා බ්‍රිතාන්‍යය, ඉන්දියාව

04. භූමිය හා ජනගහනය ප්‍රධාන නිර්ණායක ලෙස භාවිත කරමින්, ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සිදු කරනු ලබන්නේ,
(1) මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කොමිෂන් සභාව මගිනි.
(2) ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගිනි.
(3) මැතිවරණ කොමසාරිස් කාර්යාලය මගිනි.
(4) මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගිනි.

05. ' බාහිර බාධකයන්ගෙන් තොරව පුද්ගලයාට සිය පෞද්ගලිකත්වය වර්ධනය කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්තාව,' ලෙස අර්ථ දක්වන්නේ,
(1) ඒබ්‍රහම් ලින්කන් විසින් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව යි.
(2) ජී. ඩී. එච්. කෝල් විසින් නිදහස පිළිබඳවයි.
(3) සීලර් විසින් අයිතිවාසිකම් පිළිබඳවයි.
(4) අයිවර් ජෙනිංග්ස් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව යි.

06. නීතියේ ආධිපත්‍ය පවතින බව විදහාපාන ලක්ෂණයකි.
(1) සැමොම නීතියට ගරු කිරීම, අවනත වීම හා නීතිය අභිබවා යාම.
(2) පවත්නා නීතිය යටතේ නිවැරදිකරුවන්ට පවා දඬුවම් පැමිණවීම.
(3) චෝදනා පත්‍රයට අනුව පමණක් පුද්ගලයෙකු අත් අඩංගුවට ගැනීම.
(4) නීතියේ රැකවරණය පිළිබඳ වැඩි අවධානයක් යොමු නොකිරීම.

07. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දේශපාලන විධායකය වන්නේ,
(1) අගමැතිවරයායි (2) කැබිනට් මණ්ඩලයයි (3) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලයයි (4) ජනාධිපතිවරයායි

08. සන්ධීය රාජ්‍යයක සාර්ථක පැවැත්ම සඳහා තිබිය යුතු ගුණාංගයක් වන්නේ,

(1) ජන කොටස් පෞද්ගලික හැඟීමෙන් යුතුව ක්‍රියා කිරීම.

(2) රජය පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල ලෙස කටයුතු කිරීම.

(3) මූල්‍ය සම්පත් බෙදා හැරීමේ දී සාධාරණ වීම.

(4) රාජ්‍ය සපයන සුභසාධන කාර්ය වල වගකීම මධ්‍යම ආණ්ඩුවට පැවරීම.

09. පහත (අ) කොටසේ සිදුවීම්, (ආ) කොටසේ වර්ෂ සමග ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| (අ) කොටස | (ආ) කොටස |
|---|---|
| 1. විනිමය නීති ලිහිල් කිරීම | A 1978 1993 |
| 2. සලාක ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම | B 1961 1970 |
| 3. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීම | C 1994 2004 |
| 4. ප්‍රතිපත්ති සම්පාදනයේ දී ජාත්‍යන්තර උපදෙස් ලබා ගැනීම | D 1970 1977 |

(1) ADCB (2) ABCD (3) BDAC (4) DBCA

10. ආර්ථික ක්‍රියාවලිය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ආර්ථික නොවන භාණ්ඩ ඇතැම් විට ආර්ථික භාණ්ඩ වන අවස්ථා ද ඇත.

(2) ව්‍යවසායකත්වය වෙනුවෙන් කරනු ලබන ගෙවීම වැටුප නම් වේ.

(3) කුමක් කොපමණ, කෙසේ, කා සඳහා නිෂ්පාදනය කරන්නේ ද යන මේවා මූලික ආර්ථික ප්‍රශ්න ලෙස සැලකේ.

(4) පොහොර, දූව ආදිය අන්තර් භාණ්ඩ ගණයට අයත් වේ.

11. පහත (අ) කොටසේ ඇති ගැටුම් ඇතිවන මූල හා (ආ) කොටසේ ඇති "ඊට අදාල සිදුවීම්" සමග ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| (අ) | (ආ) |
|---|---|
| 1. ආගමික ගැටුම් | A සෝමාලියා ඉතියෝපියා ගැටුම |
| 2. දේශපාලන ගැටුම් | B අයර්ලන්ත යුද්ධය |
| 3. සමාජ ආර්ථික ගැටුම් | C ඊශ්‍රායල පලස්තීන ගැටුම |

(1) ABC (2) BCA (3) CBA (4) BAC

12. ව්‍යවස්ථාදායකයට අයත් කාර්යයන් පමණක් අඩංගු පිළිතුර කුමක් ද?

(1) නීති සම්පාදනය කිරීම, නීති විවරණය කිරීම, විධායකය පාලනය

(2) යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම, මුදල් පාලනය, නීති සම්පාදනය කිරීම

(3) මුදල් පාලනය, අමාත්‍යාංශ ලේකම්වරු පත් කිරීම, අයවැය ඉදිරිපත් කිරීම

(4) නීති සම්පාදනය, අයවැය සම්මත කිරීම, විධායකය පාලනය

13. පළාත් සභා සම්බන්ධයෙන් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ,

(1) ප්‍රධාන අමාත්‍යවරයෙකු හා අමාත්‍යවරු පස් දෙනෙකුට නොවැඩි පිරිසකගෙන් සමන්විත විය යුතු බවයි.

(2) ප්‍රධාන අමාත්‍යවරයෙකු හා අමාත්‍යවරු සිවු දෙනෙකුට නොවැඩි පිරිසකගෙන් සමන්විත විය යුතු බවයි.

(3) ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළුව අමාත්‍යවරු සිවු දෙනෙකුගෙන් සමන් විත විය යුතු බවයි.

(4) ප්‍රධාන අමාත්‍යවරයා හා අනෙක් අමාත්‍යවරු එක් එක් පළාත් සභා අනුව වෙනස් වන බවයි.

14. ගැටුම් නිරාකරණය සඳහා පුරවැසියෙකු තුළ තිබිය යුතු පුද්ගල ගුණාංගයකි.

(1) යහපත් අන්තර් පුද්ගල සබඳතා ඇති කර ගැනීම (2) ජය පරාජය විඳ දරා ගැනීම

(3) යුතුකම් ඉටු කිරීම (4) ආත්මාවබෝධය

15. සංවර්ධනය මැනීමේ පරමාර්ථයක් වන්නේ,

(1) ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කිරීම අවශ්‍ය වීම.

(2) ආර්ථිකයේ සදාචාරාත්මක වෙනස්කම් මැනීමට උපකාරී වීම.

(3) ආර්ථිකයේ සමාජීය වෙනස්කම් මැනීමට අවශ්‍ය වීම.

(4) ආර්ථික ගැටලු පමණක් හඳුනා ගැනීමට උපකාරී වීම.

16. මහ මැතිවරණයෙන් පත්වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 225 දෙනා අතරට අයත් වන පුද්ගලයකු වන්නේ,

(1) කතානායකවරයාය. (2) ඔම්බුඩ්ස්මන් වරයාය.

(3) ජනාධිපතිවරයාය. (4) ආණ්ඩුකාරවරයාය.

17. බ්‍රිතාන්‍ය කිරීටය වෙනුවෙන් මෙරට ආග්‍රාණ්ඩුකාර ධූරයක් ඇති කරන ලද්දේ,
(1) කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය මගිනි.
(2) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි.
(3) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි.
(4) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.

18. වර්තමාන ශ්‍රී ලංකාවේ උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකක් අඩංගු පිළිතුර වන්නේ,
(1) මන්නාරම හා වව්නියාව (2) මන්නාරම හා අම්පාර
(3) අම්පාර හා ත්‍රිකුණාමලය (4) වව්නියාව හා අම්පාර

19. පළාත්බද මහාධිකරණය සතු බලතලයකට උදාහරණයක් වන්නේ,
(1) වානිජ ආරවුල් විසඳීම.
(2) පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීම.
(3) අධිකරණසේවා කොමිෂන් සභා තීරණ විමර්ෂණය කිරීම.
(4) නාවුක අධිකරණ බලය

20. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ මින් කුමක් ද?
(1) 1948 ජනවාරි 10 දින විශ්ව ප්‍රකාශනය සම්මත කර ගන්නා ලදී.
(2) මෙම විශ්ව ප්‍රකාශය පූර්විකාවකින් හා වගන්ති 50 කින් සමන්විතය.
(3) මෙම විශ්ව ප්‍රකාශය සම්මත කර ගන්නා ලද්දේ 1998 දෙසැම්බර් 10 වන දිනය.
(4) මෙම විශ්ව ප්‍රකාශය පූර්විකාවකින් හා වගන්ති 30 කින් සමන්විතය.

21. මානව හිමිකම් කඩ වීමක් සම්බන්ධව පැමිණිලි කළ හැකි ඉහළම ජාත්‍යන්තර ආයතනය මින් කුමක් ද?
(1) එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම (2) ජාත්‍යන්තර අධිකරණය
(3) ජාත්‍යන්තර කම්කරු සංවිධානය (4) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය

22. වෙළඳපොල ආර්ථිකයක ප්‍රධාන ලක්ෂණය වන්නේ මින් කවරක් ද?
(1) නිෂ්පාදන ක්‍රියාවලියෙහි දී සෘණ බාහිරතා කෙරෙහි සැලකිලිමත් වීම.
(2) වෙළඳපොල කටයුතු වලට රාජ්‍ය මැදිහත් වීම.
(3) ආර්ථික ප්‍රශ්න විසඳීමේදී ඉල්ලුම් හා සැපයුම් බලවේග මත, ලැබෙන මිල අනුව තීරණ ගැනීමටය.
(4) ජනතාවගේ සුභසාධනය උදෙසා භාණ්ඩ නිෂ්පාදනයට ප්‍රමුඛත්වය දීම.

23. බහු සංස්කෘතික සමාජයක පුරවැසියෙකුගේ වගකීම වන්නේ,
(1) තමන්ගේ සංස්කෘතිය ඉස්මතු වන සේ කටයුතු කිරීමයි.
(2) සියලුම සංස්කෘතීන්ට ගරු කරමින් සමානව සැලකීමය.
(3) වැඩි පිරිසක් අයත්වන සංස්කෘතියට අනුගතව කටයුතු කිරීම.
(4) විවිධ සංස්කෘතීන් මිශ්‍ර වීම වැලැක්වීමට කටයුතු කිරීම.

24. තිරසාර සංවර්ධනයේ ප්‍රධාන අරමුණ වන්නේ,
(1) මනුෂ්‍ය අන්තර් ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය මානව හා භෞතික ප්‍රාග්ධනය සැපයීමයි.
(2) නවීන තාක්ෂණයක් සමග ලෝකයේ සෙසු රටවල් අභිබවා ඉදිරියට ගමන් කිරීමයි.
(3) ස්වභාවික සම්පත් කළමනාකරණය කර ගනිමින් මිනිස් අවශ්‍යතා හා බලාපොරොත්තු ඉටු කිරීමයි.
(4) සමාජයේ පවතින විවිධ සංස්කෘතික අංග පරිසරය සමග සමෝධානය කිරීමයි.

- **පහත දක්වෙන්නේ ඒකීය හා සන්ධීය ආණ්ඩුක්‍රම වල අඩංගු මූලික ලක්ෂණ කිහිපයකි. ඒවා අනුසාරයෙන් අංක 25 හා 26 යන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A එක් මධ්‍යම බල අධිකාරියක් තුළ බලය සංකේන්ද්‍රණය වීම.
B බලය මධ්‍යම හා ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදී පැවතීම.
C දෙවන මණ්ඩලයක් පැවතීම.
D බහු වාර්ගික සමාජයක් සඳහා වඩාත් උචිත වීම.
E අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය ඉහළ උසාවි වලට පවරා තිබීම.
F ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පහසුවෙන් වෙනස් කළ හැකි වීම.
G ඒකීය පුරවැසි බවක් පැවතීම.

25. ඒකීය ආණ්ඩු ක්‍රමයකට වඩාත් සුදුසු කාණ්ඩය වන්නේ මින් කුමක් ද?
(1) ABC (2) AFG (3) BCD (4) CDE

26. සන්ධීය ආණ්ඩු ක්‍රමයකට අදාළ ලක්ෂණ අඩංගු කාණ්ඩය වන්නේ මින් කවරක් ද?
(1) ABC (2) BCD (3) CEF (4) DFG

27. 1924 ජිනීවා ප්‍රකාශනයේ සැලකිල්ල යොමු කළේ,
(1) යුද්ධයෙන් පීඩාවට පත් වූවන්ගේ අයිතිවාසිකම් පිළිබඳවයි.
(2) ළමා අයිතිවාසිකම් පිළිබඳවයි.
(3) සරණාගතයන්ගේ අයිතිවාසිකම් පිළිබඳවයි.
(4) සමාජ සුරක්ෂිතතාවය සඳහා ඉටු කළ යුතු යුතුකම් පිළිබඳවයි.

28. සාප්පු කාර්යාල සේවක පනත, ප්‍රසූති ආධාර ආඥා පනත ආදී පනත් සම්මත කරගෙන ඇත්තේ,
(1) කම්කරු අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ය.
(2) ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ය.
(3) කර්මාන්ත හා වෙළඳාමේ අභිවෘද්ධිය උදෙසාය.
(4) කාන්තා අයිතීන් සුරක්ෂිත කිරීම සඳහාය.

29. ශ්‍රී ලංකාවේ මුල් වරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මූලික අයිතිවාසිකම් ඇතුලත් කිරීමේ වැදගත් පියවරක් අනුගමනය කර ඇත්තේ,
(1) 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි. (2) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.
(3) 18 වෙනි ව්‍යවස්ථා සංශෝධනය මගිනි. (4) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි.

30. පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල ප්‍රයෝජනයක් වන්නේ මින් කවරක් ද?
(1) ශක්තිමත් ආණ්ඩුවක් ගොඩනගා ගැනීම.
(2) දේශපාලන ආධාරකරුවන්ට අවස්ථා උදාකර දීම.
(3) ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම.
(4) ප්‍රාදේශීය සංවර්ධන කටයුතු ඵලදායි ලෙස ඉටු කර ගැනීම හා වේගවත් කිරීම.

31. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියට එකතු කල දෙවන වෛකල්පිත සම්මුතියෙහි අරමුණ වූයේ,
(1) මරණ දඬුවම අහෝසි කිරීම යි. (2) ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම යි.
(3) කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම යි. (4) දේශපාලන අයිතිවාසිකම් තහවුරු කිරීම යි.

32. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ගයක් වන්නේ මින් කවරක් ද?
(1) ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය පිහිටුවීම.
(2) පවුල් සබඳතා ආරක්ෂා කිරීම.
(3) සමාජ සුරක්ෂිතතාව සැලසීම.
(4) සෑම විටම ළමයාගේ යහපත සැලසෙන ලෙස කටයුතු කිරීම.

33. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය තුළ දැකිය හැකි මූලික ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1) බ්‍රිතාන්‍ය කිරීටය වෙනුවෙන් ආණ්ඩුකාර ධූරයක් ඇති කිරීම.
(2) අවසාන අභියාචනාධිකරණය ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය ක්‍රියා කිරීම.
(3) ඒකමාණ්ඩලික ව්‍යවස්ථාදායකයන් හඳුන්වා දීම.
(4) කැබිනට් ආණ්ඩුක්‍රමයක් හඳුන්වා දීම.

34. රටවල් සතු ආර්ථික හා මානව සම්පත් නිසි ආකාරව කළමනාකරණය නොවී, ආර්ථික සංවර්ධනය මන්දගාමී වී, සමාජ සාධාරණත්වය බිඳ වැටීම සඳහා වර්තමානයේ හේතු වී ඇත්තේ මින් කුමක් ද?
(1) රාජ්‍ය පාලනයේ කාර්යක්ෂමතාවය (2) රාජ්‍ය තුළ බලය මධ්‍යගත වීම
(3) රාජ්‍ය පාලකයින් වගකීමෙන් කටයුතු කිරීම (4) නිලධාරීවාදය

35. "සංවර්ධනය යනු ලෝක ජනතාවගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීමයි." මෙම ප්‍රකාශය කළේ,
(1) 1978 යුනෙස්කෝ ප්‍රකාශය මගිනි (2) 1961 70 එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංවර්ධන දශකය මගිනි.
(3) ඩඩ්ලි සියර්ස් විසිනි (4) බ්‍රන්ඩ්ලන්ඩ් කොමිසම මගිනි

36. සංවර්ධනය වන රටවල් මුහුණපාන ගැටලුවකි.
(1) ප්‍රාග්ධන භාණ්ඩවල මිල උච්චාවචනය (2) අමු ද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුව
(3) නව කාර්මික රට වලින් එල්ල වන වෙළඳපොල තරගය (4) ප්‍රාථමික භාණ්ඩ වල මිල උච්චාවචනය

37. සංවර්ධිත රටවල් පමණක් දක්වා ඇති පිළිතුර තෝරන්න.
(1) ස්වීඩන්, නෝර්වේ, කැනඩාව, බෙල්ජියම
(2) ජපානය, ප්‍රංශය, සියොරාලියොන්, බෙල්ජියම
(3) ඉන්දියාව, බංගලාදේශය, සෝමාලියාව, ඉතියෝපියාව
(4) ඇමරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය, ජපානය, බංගලාදේශය

38. වෙළඳ ගිවිසුම් අහෝසි කරමින් ජාත්‍යන්තර වෙළඳාම තුළින් ශ්‍රී ලංකාවට කල බලපෑමකට උදාහරණයක් වන්නේ,
(1) සීපා ගිවිසුම අත්සන් කිරීම යි. (2) VAT බදු වැඩි කිරීම යි.
(3) GSP සහන අහෝසි කිරීම යි. (4) ලෝක බැංකු පොළිය වැඩි කිරීම යි.

39. ලෝක බල කඳවුරු දෙක මත පදනම් ව යුදමය අරමුණ මත බිහිකරගත් කලාපීය සංවිධානයකි,
(1) යුරෝපා ආර්ථික ප්‍රජාව (2) උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය (NATO)
(3) සාර්ක් සංවිධානය (4) උන්ක්ටාඩ් (UNCTAD) සංවිධානය

40. 1944 දී ආරම්භ කරන ලද පොදු රාජ්‍ය මණ්ඩලය (common wealth) හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) පොදු රාජ්‍ය මණ්ඩලයේ නායකයා වන්නේ බ්‍රිතාන්‍ය රජු හෝ රැජිනයි.
(2) පොදු රාජ්‍ය මණ්ඩලය යුරෝපා රටවල් පමණක් සාමාජිකත්වය දරයි.
(3) පොදු රාජ්‍ය මණ්ඩලයේ වත්මන් ලේකම් වන්නේ බැන් කී මූන් මහතාය.
(4) පොදු රාජ්‍ය මණ්ඩලය ආරම්භ කරන ලද්දේ ඇමරිකානු ජනාධිපතිවරයා විසිනි.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016
## පුරවැසි අධ්‍යාපනය II

**11 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

උපදෙස් :
- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.
- I වන ප්‍රශ්නය සඳහා ලකුණු 20 ක් ද, අනෙක් ප්‍රශ්න 4 ට ලකුණු 40 ක් ද හිමිවේ.

01. (1) 15 සියවසෙන් පසු යුරෝපයේ ජාතික රාජ්‍ය බිහි වීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

(2) ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට ඇති වී තිබෙන ධනාත්මක බලපෑම් දෙකක් සඳහන් කරන්න.

(3) ගැටුම් නිරාකරණය සඳහා යොදා ගත හැකි ක්‍රමවේද දෙකක් සඳහන් කරන්න.

(4) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක රෝම ලන්දේසි පොදු නීතියට අමතරව ක්‍රියාත්මක වන වෙනත් විශේෂ නිති වර්ග දෙකක් ලියන්න.

(5) දිසා අධිකරණයක විභාග වන නඩු වර්ග දෙකක් සඳහන් කරන්න.

(6) 1972 පළමු ජනරජ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් ලියන්න.

(7) මානව අයිතිවාසිකම් දිනා ගැනීමේ ඓතිහාසික අවස්ථා දෙකක් සඳහන් කරන්න.

(8) ශ්‍රී ලංකාව කාන්තාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග දෙකක් පෙන්වා දෙන්න.

(9) රටක සංවර්ධනය මැනීමෙහිලා භාවිතා කරන සාම්ප්‍රදායික සංවර්ධන මිනුමක් ද නූතන සංවර්ධන මිනුමක් ද දක්වන්න.

(10) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආර්ථික හා සමාජ මණ්ඩලයට අනුබද්ධිත සංවිධාන දෙකක් නම් කරන්න. (ල. 2 × 10 = 20)

02. (1) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටළු දෙකක් දක්වන්න. (ල. 02)

(2) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක පැවතිය යුතු අංග ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)

(3) රටක යහ පැවත්මට තරගකාරී පක්ෂ ක්‍රමය ඉවහල් වන ආකාරය පිළිබඳ කරුණු තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල. 05)

03. (1) රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න. (ල. 02)

(2) ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය සැලකිල්ලට ගත් විට එහි ප්‍රධාන ආයතන තුනක් ක්‍රියාත්මක වේ. එම ආයතන තුන ලියා දක්වන්න. (ල. 03)

(3) ජනාධිපති ආණ්ඩු ක්‍රමයකට වඩා පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය තුළ, විධායකය හා ව්‍යවස්ථාදායකය අතර බැඳීමක් පවතින බවට කරුණු තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ල. 05)

04. (1) ශ්‍රී ලංකාවේ බලය බෙදාහැරීමේ හා බලය විමධ්‍යගත කිරීමේ අතීත අවස්ථා දෙකක් දක්වන්න. (ල. 02)

(2) ශ්‍රී ලංකාවේ පළාත් සභා සතු බලතල හා කාර්යයන් ලැයිස්තු තුනක් යටතේ දක්වා ඇත. එම එක් එක් ලැයිස්තුවට අයත් කාර්යයන් එක බැගින් දක්වන්න. (ල. 03)

(අ) පළාත් සභා ලැයිස්තුව

(ආ) සංවෘත ලැයිස්තුව

(ඇ) සමගාමී ලැයිස්තුව

(3) වත්මන් බොහෝ රාජ්‍යයන් බලය බෙදාහැරීම කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල. 05)

05. (1) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමෙහි ලා බලපා ඇති සාධක දෙකක් දක්වන්න. (ල. 02)

(2) බහු සංස්කෘතික සමාජයක දකිය හැකි මූලික ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)

(3) රාජ්‍ය ආර්ථික ක්‍රියාවලියෙහි ලා ධනවාදී අර්ථ ක්‍රමයකට වඩා, සමාජවාදී අර්ථ ක්‍රමය වෙනස් වන අයුරු කරුණු තුනක් ඔස්සේ සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

06. (1) නීතියේ පැවතිය යුතු අත්‍යවශ්‍ය ගුණාංග දෙකක් දක්වන්න. (ල. 02)

(2) ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලතල තුනක් ලියන්න. (ල. 03)

(3) ශ්‍රී ලංකා අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව තුළ ඇති ප්‍රතිපාදන තුනක් නම් කොට ඉන් එකක් පැහැදිලි කරන්න. (ල. 05)

07. (1) පරිසරයෙන් අපට ලැබෙන සේවාවක් දෙකක් ලියන්න. (ල. 02)

(2) ජෛව පරිසරයට හානි පැමිණවීම නිසා ඇතිවන ප්‍රතිඵල තුනක් සඳහන් කරන්න. (ල. 03)

(3) පරිසරය සම්බන්ධ පුරවැසි වගකීම් හා යුතුකම් තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | (4) | 02 | (3) | 03 | (4) | 04 | (1) | 05 | (2) | 06 | (3) | 07 | (3) | 08 | (3) |
| 09 | (3) | 10 | (2) | 11 | (2) | 12 | (4) | 13 | (2) | 14 | (4) | 15 | (1) | 16 | (1) |
| 17 | (2) | 18 | (1) | 19 | (1) | 20 | (4) | 21 | (1) | 22 | (3) | 23 | (2) | 24 | (3) |
| 25 | (2) | 26 | (2) | 27 | (2) | 28 | (1) | 29 | (4) | 30 | (4) | 31 | (1) | 32 | (1) |
| 33 | (4) | 34 | (4) | 35 | (2) | 36 | (4) | 37 | (1) | 38 | (3) | 39 | (2) | 40 | (1) |

## II කොටස

01. (1) * රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ * පුනරුදය * වැඩවසම් ක්‍රමය බිඳ වැටී ධනවාදී ආර්ථිකයක් ගොඩනැගීම. * විද්‍යාත්මක දැනුම වර්ධනය (2) * විදේශ ආයෝජන හා තාක්ෂණය ගලා ඒම. * දේශීය නිෂ්පාදන වලට වැඩි ඉල්ලුමක් ඇති වීම.......... ආදී ලෙස (10 පුරවැසි 90 පිටුව) (3) * සාකච්ඡා කිරීම * සහමන්ත්‍රණය, විනිසීම ආදී ලෙස (10 පුරවැසි 100, 101, 102 පිටු) (4) * උඩරට නීතිය * තේසවලාමේ නීතිය * මුස්ලිම් නීතිය (5) * විවාහ නඩු, ඉඩම් නඩු, ආදී ලෙස (11 පුරවැසි 12, 13 පිටු) (6) * ඩොමිනියන් තත්ත්වය අහෝසි වී ස්වාධීන ජනරජයක් බවට පත් වීම ආදී........ (11 පුරවැසි 28 පිටුව) (7)* 1215 මැග්නා කාර්ටා ගිවිසුම * 1689 බ්‍රිතාන්‍ය අයිතිවාසිකම් පනත * ඇමෙරිකානු / ප්‍රංශ ප්‍රකාශන * රුසියානු විප්ලවය (8) * 1993 කාන්තා ප්‍රඥප්තිය සකස් කිරීම ආදී (11 පුරවැසි 59, 60 පිටු) (9) * දළ ජාතික නිෂ්පාදිතය, භෞතික ජීවන තත්ව දර්ශක ආදී සාම්ප්‍රදායික එකක් හා නූතන එකක් බැගින් (11 පුරවැසි 106 පිටුව) (10) * ආහාර හා කෘෂිකර්ම සංවිධානය (F A O) * එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (යුනිසෙෆ්) ආදී ලෙස..... (11 පුරවැසි 141, 142 පිටු)

02. (1) ● රාජ්‍ය භූමිය ප්‍රමාණයෙන් විශාල වීම ● අධික ජනගහනය ● සියලු පුරවැසියන් එක් තැනකට එක්රැස් කිරීමේ අපහසුව ● සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම (2) ⋆ සර්ව ජන ඡන්දබලය පදනම්ව ආණ්ඩු සහ පාලකයන් තෝරා ගැනීම ⋆ තරඟකාරී පක්ෂ ක්‍රමයක් පැවතීම ⋆ නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම ආදී ලෙස (3) ⋆ ජනමතය නියෝජනයට ඉඩකඩ පැවතීම ⋆ අත්තනෝමතික පාලනය බිහිවීම වැලක්වීම ⋆ ආණ්ඩුවේ අහිතකර ප්‍රතිපත්ති විවේචනය තුළින් නිවැරදි වීම ආදී ලෙස (ල. 5 ) (3 + 2 විස්තරයට)

03. (1) ඒකීය හා සන්ධීය (2) ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය (3) * විධායකය සිය කටයුතු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායකයට සාමූහික වගකීමට බැඳී සිටීම * ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත්වන බැවින් ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සම්බන්ධතාවය පැවතීම ආදී ලෙස (ල. 05) (3 +2 ලෙස)

04. (1) * පණ්ඩුකාභය රජු ගම් පාලනය සඳහා ගාමිණී වැනි නිලධාරීන් පත් කිරීම. * පරාක්‍රමබාහු රජු ප්‍රාදේශීය පාලකයන් පත් කිරීම * 1815 බ්‍රිතාන්‍යයන් විසින් පළාත් මට්ටමින් රෙසිඩන්ට්වරයෙකු පත් කිරීම. (2) (a) පළාත් සභාවට අදාල ආර්ථික සැලසුම් පළාත්පාලන ආයතන, නිවාස හා සංවර්ධන වාඩසටහන් ආදී (10 පුරවැසි 50, 51 පිටු) (b) ජාතික ප්‍රතිපත්ති සම්පාදනය, විදේශ කටයුතු ආදී (c) සැලසුම් කිරීම ජාතික නිවාස හා ඉදිකිරීම් ආදී.... (3) * විවිධත්වය තුළ එක්සත්කම ගොඩනැගීමේ අවශ්‍යතාවය, * එක් මධ්‍යස්ථානයක සිට පාලන කටයුතු කිරීමේ අපහසුතාවය, * ජාතික ආරක්ෂාව තහවුරු කර ගැනීම ආදී.... (ල. 5යි 3 + 2 විස්තරයට)

05. (1) භූගෝලීය පිහිටීම, සංක්‍රමණ, ආක්‍රමණ ආදී... (2) ● විවිධ ජාතීන් / ආගම් / භාෂාවන්ගෙන් සැදුම් ලත් අය එකම සමාජයක විසීම. ● ඒ ඒ සංස්කෘතීන්ට ආවේණික සිරිත් විරිත් ආචාර ධර්ම පැවතීම ● ප්‍රාදේශීය විවිධත්ව තුළ එක්ව විසීම ආදී (3) ● සමාජවාදී ආර්ථිකය මෙහෙයවන්නේ මධ්‍ය සැලසුම් මණ්ඩලයක් මගින් බව, ● දේපල අයිතිය රජය සතු බව, ● පොදු යහපත හා අවශ්‍යතාවය අරමුණු කරගත් බව ආදී.. (ල. 5යි 3 + 2 විස්තරයට)

06. (1) ⋆ යුක්ති සහගත හා සාධාරණ බව ⋆ පොදු සමාජ යහපත අරමුණු කොටගෙන පැනවීම. ⋆ නිරවුල් හා පැහැදිලි බව ආදි.... (11 පුරවැසි 2 පිටුව) (2) ⋆ මූලික අයිතිවාසිකම් කඩවීමේ පෙත්සම් විභාගය ⋆ රීති සැකසීම ⋆ ජනාධිපතිවරණ පෙත්සම් විභාග කිරීම ආදී..... (11 පුරවැසි 9 පිටුව) (3) ⋆ විනිශ්චයකාරවරු පත්කිරීමේ / ඉවත්කිරීමේ ක්‍රමවේද ⋆ අනවශ්‍ය මැදිහත්වීම් පාලනය ⋆ අධිකරණ සේවා කොමිසම පිහිටුවීම ආදී.... (11 පුරවැසි 21, 22 පිටු) (ල. 5යි 3 + 2 විස්තරයට)

07. (1) ⋆ ජීව උපකාරක සේවා ⋆ ආර්ථික උපකාරක සේවා ⋆ අපද්‍රව්‍ය අවශෝෂණ සේවා (2) ⋆ ජෛව පරිසර තුලිතතාව බිඳ වැටීම ⋆ ආවේනික ශාක හා සත්ව ප්‍රජාවන් විනාශ වීම ⋆ ජෛව පද්ධතීන්ගේ ක්‍රියාකාරිත්වය බිඳ වැටීම ⋆ ආහාර දාම හා ආහාර ජාල දාම බිඳ වැටීම ⋆ ආක්‍රමණශීලී ශාක හා සත්ව ප්‍රජා බිහිවීම (3) ⋆ පාරිසරික සම්පත් අරපිරිමැස්මෙන් භාවිතය ⋆ නොදිරන අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීමෙන් වැලකීම ⋆ අපද්‍රව්‍ය පතිචක්‍රීකරණය (පෙළපොත 103 පිටුව) (ල. 5යි 3 + 2 විස්තරයට)